කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 8 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලයඃ පැය 02 |
|---|---|---|

නම: ..........................................................................................................

I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පොදුවේ සියළුම ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි වනසේ රජය හෝ පෞද්ගලික අංශය මගින් සපයන සේවාවන්

I. සුභසාධන සේවා වේ
II. රාජ්‍ය සේවා වේ
III. පොදු සේවා වේ
IV. පෞද්ගලික සේවා වේ

(2) නිදහස් අධ්‍යාපනය පොදු සේවාවක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ

I. ක්‍රි.ව. 1945 පසුව ය
II. ක්‍රි.ව. 1948 පසුව ය
III. ක්‍රි.ව. 1972 පසුව ය
IV. ක්‍රි.ව. 1931 පසුව ය

(3) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව ළමයින් ලෙස පිළිගැනෙනුයේ

I. අවුරුදු 18 සම්පූර්ණ කළ පුද්ගලයින් ය
II. අවුරුදු 18 සම්පූර්ණ නොකළ පුද්ගලයින් ය
III. අවුරුදු 18 වැඩි පුද්ගලයින් ය
IV. අවුරුදු 14 ට අඩු පුද්ගලයින් ය

(4) වර්තමානයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන පාලන ක්‍රමය වන්නේ

I. ඒකාධිපති
II. ප්‍රජාතන්ත්‍රවාදී
III. රාජාණ්ඩු
IV. යටත් විජිත

(5) "සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූ දැනුම, විශ්වාසය, කලා, සදාචාර හා වෙනත් හැකියාවන්ගේ සමස්තය, සංස්කෘතිය වේ." යන්න ප්‍රකාශ කළේ

I. මහාචාර්ය විමල් දිසානායක
II. බර්ට්‍රන්ඩ් රසල්
III. ඊ.බී. ටයිලර්
IV. ක්ලෝඩ් ස්ට්‍රවුස්

(6) එම රටක් තුළ විවිධ ජනවර්ග ජීවත්වන, විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතාකරන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරනු ලබන මිනිසුන්ගෙන් සමන්විත සමාජයක් හඳුන්වන්නේ

I. බහු ජාතික
II. බහු ආර්ථික
III. බහු වාර්ගික
IV. බහු සංස්කෘතික

(7) ක්‍රි.ව. 2012 ජනසංඝනණයට අනුව ශ්‍රී ලංකාවේ සිංහල ජනවර්ගයට අයත්වන ප්‍රතිශතය වන්නේ

I. 75% කි
II. 72% කි
III. 80% කි
IV. 65% කි

(8) සිරිත් යනු අප විසින් සිදු කරනු ලබන චාරිත්‍ර වේ. විරිත් යනු

I. අප විසින් රැකගත යුතු දේවල් ය
II. ජීවිතය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය දේවල් ය
III. අප විසින් නොකළ යුතු දෙවල් ය
IV. අප පසු පරපුරට දිය යුතු දෙවල් ය

(9) තිරසාර සංවර්ධනය සම්බන්ධව පුරවැසි යුතුකමක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?

I. සම්පත් අධිපරිභෝජනයෙන් වැලකීම

II. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය දිරිගැන්වීම

III. පරිසර හිතකාමී විකල්ප බලශක්ති පිළිබඳ අවධානය නොකිරීම

IV. සම්පත් අසීමිතව පරිභෝජනය

(10) පාරිසරික ගැටළු ඇතිවීම කෙරෙහි බලපාන මූලික හේතුව ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?

I. පරිසර සම්පත් අසීමිතව පරිභෝජනය

II. පරිසර නීති ප්‍රමාණවත් නොවීම

III. පරිසරය පිළිබඳ ජනතාව තුළ යහපත් ආකල්ප නොමැතිවීම

IV. පරිසරයට අපද්‍රව්‍ය මුදාහැරීම

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට 'අ' සහ 'ඉ' තීරු එකිනෙක ගලපා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(11)

| "අ" | "ඉ" |
|---|---|
| i. අපරාධ පිළිබඳ මූලික විමර්ශන කටයුතු සිදුකිරීම | A. සන්නිවේදන සේවා |
| ii. එදිනෙදා සිදුවන වැදගත් සිදුවීම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම | B. හමුදා සේවය |
| iii. විශ්‍රාම වැටුප් හා රජය මගින් සපයන මහජන මුදල් ගෙවීම | C. පොලිස් සේවය |
| iv. අභ්‍යන්තර කැරලි කෝලාහල හා ත්‍රස්තවාදී කටයුතු මර්දනය | D. තැපැල් සේවය |

I. CADB II. CBAD III. CABD IV. BCAD

(12)

| "අ" | "ඉ" |
|---|---|
| i. එකා සැමටත් සැම එකාටත් ආදර්ශ පාඨය | A. සමාජ ආරක්ෂණ ජාලය |
| ii. පරිසර සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ආයතනයකි | B. අධ්‍යාපනය |
| iii. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සුභසාධක වැඩසටහන | C. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |
| iv. ජාති අවශ්‍යතාවන්ට ගැලපෙන පිරිස් සමාජයට දායාද කිරීම | D. සමුපකාරය |

I. DACB II. CDAB III. ABCD IV. DCAB

(13)

| "අ" | "ඉ" |
|---|---|
| i. දක්ෂතා වර්ධනයට ඉඩක් නොදීම | A. නාමික නායකත්ව ශෛලිය |
| ii. නීතිරීති, සිරිත් විරිත්, සම්ප්‍රදායන්ට ගරු නොකිරීම | B. ඒකාධිපති නායකත්ව ශෛලිය |
| iii. තමා කැපී පෙනීමට උත්සාහ දැරීම | C. ප්‍රජාතන්ත්‍රවාදී ශෛලිය |
| iv. නිදහස සමානාත්මතාව අගය කිරීම හා තහවුරු කිරීම | D. දූෂිත නායකත්ව ශෛලිය |

I. DABC II. BDAC III. DBCA IV. CBDA

"අ" | "ආ"

(14) i. විහාරාධිපති — A. සිසු දරු දැරියන්
ii. ජනාධිපතිවරයා — B. දායක දායිකාවන්
iii. විදුහල්පති — C. ඡන්ද දායකයින්
iv. මන්ත්‍රීවරයා — D. රටවැසියන්

I. BCDA II. BCAD III. BDAC IV. ACBD

"අ" | "ආ"

(15) i. ඇසල උත්සවය — A. හින්දු සංස්කෘතිය
ii. තෛපොංගල් උත්සවය — B. ක්‍රිස්තියානි සංස්කෘතිය
iii. පාස්කු උත්සවය — C. ඉස්ලාම් සංස්කෘතිය
iv. රාමසාන් උත්සවය — D. බෞද්ධ සංස්කෘතිය

I. DABC II. DBAC III. ACBD IV. BCAD

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

(16) පෘථිවි අභ්‍යන්තරයේ භෞතික ක්‍රියාවලීන් හේතු කොට ගෙන සිදුවන ස්වාභාවික විපතක් වනුයේ .................................................. ය.

( සුළි සුළං , එල්නිනෝ , සුනාමි )

(17) ප්‍රමාණවත් නොවන වර්ෂාපතනය නිසා ඇතිවන නියඟ, ...................................... නියඟ ලෙස හැඳින්වේ.

( කාලගුණ , දේශගුණ , ජලවිද්‍යාත්මක )

(18) වර්තමන ලෝකයේ ඉතා දියුණු රටවල ජනතාව පවා තම කාර්යයන් ඉටුකර ගැනීමේ දී පරිසර හිතකාමී වාහනයක් ලෙස ........................................................ භාවිත කරති.

( යතුරුපැදිය , පාපැදිය , ත්‍රී විලරය )

(19) ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයකි, ........................................................ .

( යුනෙස්කෝ , යුනිසෙෆ් , ලෝක බැංකුව)

(20) ඔබ ප්‍රදේශයේ පාසල්වල කටයුතු ක්‍රමවත් ව පවත්වාගෙන යාමටත්, අවශ්‍ය පහසුකම් ලබා දීමටත් සහාය වන සමීපතම ආයතනය වන්නේ ........................................................ අධ්‍යාපන කාර්යාලය යි.

( කලාප , පළාත් , දිස්ත්‍රික් )

| කැලණිය අධ්‍යාපන කලාපය |
|---|
| දෙවන වාර පරීක්ෂණය - 2017 |

| 8 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය: පැය |
|---|---|---|

II පත්‍රය

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවිය යුතු සම්පූර්ණ ප්‍රශ්න ගණන <u>පහකි</u>.**

(1) I. සන්නිවේදන මාධ්‍යය හා අවට පරිසරයෙන් 2017 වර්ෂයේදී අසන්නට දකින්නට ලැබුණු හදිසි ආපදා තත්ත්වයන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. ඉහත දැක්වූ ආපදා ඇතිවීම කෙරෙහි බලපා ඇති. මිනිස් ක්‍රියාකාරකම් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

III. හදිසි ආපදා තත්ත්වයන්ගෙන් ඇතිවන හානි අවම කර ගැනීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා 3 ක් ලියන්න. (ලකුණු 3)

IV. හදිසි අනතුරු / ආපදා සම්බන්ධව කටුයුතු කරන ආයතන තුනක් නම් කරන්න. (ලකුණු 3)

V. හදිසි අනතුරු / ආපදා වලදී ''පළමුවත් ආරක්ෂාව'' , ''දෙවනුවත් ආරක්ෂාව'' යන්න සිහිතබාගත යුතු ය. මේ පිළිබඳ ඔබේ අදහස් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(2) I. මහජනයා වෙත සපයන ආකාරය අනුව පොදු සේවා වර්ග කර ඇත. ඉන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

II. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III. පොදුසේවා ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට බලපාන ආකාරය කරුණු දෙකක් මගින් දක්වා ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5)

(3) I. පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීම අවශ්‍ය වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

II. සෞඛ්‍ය සේවය මගින් ඉටුකරනු ලබන කාර්යයන් හතරක් හඳහන් කරන්න. (ලකුණු 4)

III. වර්තමානයේ වර්ධනය වෙමින් පවතින බෝනොවන වර්ගයේ රෝග දෙකක් සඳහන් කර, එම රෝගයන්ගෙන් වැලකී සිටීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(4) I. ඔබේ පවුල තුළ සියළුම සාමාජිකයින් සමගියෙන් කටයුතු කරනු ලබන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II. ඔබේ පාසල තුළ ක්‍රියාත්මක විෂය සමගාමී ක්‍රියාකාරකම් 4 ක් නම් කරන්න. (ලකුණු 4)

III. ''යුතුකම්වලින් තොර අයිතිවාසිකම් අර්ථ විරහිත ය'' ළමා අයිතිවාසිකම් 2 ක් නම් කර ඒ හා බැඳි යුතුකම් එක බැගින් වෙන වෙනම නම් කරන්න. (ලකුණු 5)

(5) I. නායකයෙකු සතු වියයුතු ගුණාංග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II. සමාජයකට නායකයෙකු අවශ්‍ය වීමට හේතුවන කරුණු 4 ක් නම් කරන්න. (ලකුණු 4)

III. ගැටුම් අවම සමාජයක් ගොඩනැගීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(6) I. ශ්‍රී ලංකාව හැර බහු සංස්කෘතික සමාජ පවතින රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බහු සංස්කෘතික ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. ශ්‍රී ලංකාවේ ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩ නගාගැනීමෙන් අත්කරගත හැකි වාසි දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(7) I. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ස්වාභාවික විපත් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

II. අනතුර හා ආපදාවක දී සහය ලබාගත හැකි ආයතන 4 ක් නම් කරන්න. (ලකුණු 4)

III. අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා සිදුවන විපත් දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)